සබරගමුව පළාත් අධ්‍යාපන කාර්යාලය- සති පාසල

විෂය : ව්‍යාපාර හා ගිනුම්කරණ අධ්‍යයනය

සති පාසල : 2021.06.07 සිට 2021.06.11 දක්වා

ශ්‍රේණිය :10

සකස් කරන ලද්දේ: දෙහිඕවිට අධ්‍යාපන කලාපය

## 5 පාඩම - ගිනුම්කරණ සමීකරණය

## ගිනුම්කරණ සමීකරණයට ඇතුළත් කර ඇති ගනුදෙනු හඳුනා ගැනීම.

පහත දැක්වෙන නිදසුන හොඳින් අධ්‍යයනය කරන්න.
පහත දැක්වෙන්නේ විශ්මිතගේ ව්‍යාපාරයේ 2021 මැයි මස සිදු වූ ගනුදෙනු ගිනුම්කරණ සමීකරණයට ඇතුළත් කර තිබූ ආකාරයයි.

| | වත්කම් | | | | = | හිමිකම් | + | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | යන්ත්‍ර | + බඩු තොග | + ණයගැති | + මුදල් | = | ප්‍රාග්ධනය | + | ණයහිමි | + බැංකු ණය |
| | 500 | + 150 | + 100 | + 150 | = | 600 | + | 250 | + 50 |
| 1. | | + 100 | | - 50 | = | | + | 50 | |
| 2. | | | | - 10 | = | - 10 | | | |
| 3. | | | | - 50 | = | | - | 50 | |
| 4. | | - 100 | + 150 | | = | + 50 | | | |
| 5. | | | | + 150 | = | + 150 | | | |
| 6. | | | - 100 | + 100 | | | | | |
| 7. | +100 | | | - 100 | | | | | |
| 8. | | | | -30 | = | - 5 | | | + 25 |
| 9. | | - 5 | | | = | - 5 | | | |
| 10. | | | | | = | + 25 | | - 25 | |

මාසය තුළදී අයිතිකරු මුදල් ගැනිලි සිදු කර නොමැත.
ඉහත දක්වාඇති ගනුදෙනු විස්තර කිරීම පහත පරිදි සිදු කළ හැකිය.

පළමුව ඇත්තේ 2021.05.01 දිනට ව්‍යාපාරයේපැවති ආරම්භක ශේෂයන්ය.
ඒ අනුව මෙම ව්‍යාපාරයේ 2021.05.01 දිනට රු ; 500,000 ක යන්ත්‍රයක්ද, රු ; 150,000 ක බඩු තොගයක්ද , රු ;100,000 ක ණයගැතියන්ද, රු; 150,000 ක මුදල්ද වත්කම් ලෙස පවතී.
එමෙන්ම රු; 250,000 ක ණයහිමියන්ද, රු : 50,000 ක බැංකු ණයක්ද, වගකීම් ලෙස පවතී.
ඒ අනුව ව්‍යාපාරයේ හිමිකම රු; 600,000 කි.

1. රු ;100,000 ක බඩු තොග සඳහා රු : 50,000 ක් මුදලින් ගෙවා ඉතිරිය ණය පදනම මත ලබා ගැනීම.
2. ව්‍යාපාරයේ මාසික කඩ කුලිය ගෙව්වා රු : 10,000 යි.
3. ණයහිමියන්ට මුදලින් ගෙව්වා රු ; 50,000 යි.
4. පිරිවැය රු : 100,000 ක් වූ බඩු තොගයක් රු ; 150,000 කට ණයට විකුණුවා.
5. අමතර ප්‍රාග්ධනය යෙදුවා රු : 150,000 යි.
6. ණයගැතියන්ගෙන් මුදල් ලැබුණා රු : 100000 යි.
7. යන්ත්‍රයක් මිලදී ගත්තා රු ; 100,000
8. රු : 5,000 ක පොලියක්ද සහිතව බැංකු ණය වාරිකය ගෙව්වා රු : 30,000
9. අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු : 5,000
10. ව්‍යාපාරයේ අයිතිකරු විසින් ණයහිමියන්ට ගෙව්වා රු : 25,000 යි.

ඔබගේ පෙළපොතේ පිටුඅංක 64 හි සඳහන් අභ්‍යාස විසඳා ඇති ආකාරය හොඳින් අධ්‍යයනය කර පිටු අංක 66 හි සඳහන් ක්‍රියාකාරකම් 01 සහ පිටු අංක 68 හි සඳහන් ක්‍රියාකාරකම 04 සඳහා පිළිතුරු සපයන්න.